# ආණ්ඩුක්‍රම සංශෝධනය සඳහා ජනතා අදහස් විමසීම කෑගල්ලෙන් අරම්භකළ දා...






අවස්ථාවට සහභාගි වූ විධායක අධ්‍යක්ෂවරයා ඇතුළු පිරිස සහ ඒ සඳහා අදහස් දැක්වීමට සහභාගි වූ පිරිස

ඡායාරූපය -බුලත්කොහුපිටිය සමූහ

**@ බුලත්කොහුපිටිය සමූහ**
**ඩබ්ලිව්.රෝහණ**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ එක් අංගයක් වන මැතිවරණ ක්‍රමය පිළිබඳව දිස්ත්‍රික් මට්ටමෙන් ජනතාවගේ අදහස් ලබා ගැනීම පැපරල් සංවිධානය විසින් මේ වන විට ආරම්භ කර තිබේ.මේ යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් අදහස් ලබා ගැනීම පසුගියද කෑගල්ල තැපල් සංකීර්ණ ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.මේ සඳහා විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් 30 ක් පමණ සහභාගි වී සිටියහ.

මෙහි දී නව මැතිවරණ ක්‍රමයක් පිළිබඳ විවිධ මත ඉදිරිපත් කරනු ලැබිය.මෙම අවස්ථාවට පැපරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටි ආරච්චි, එම සංවිධානයේ වැඩ සටහන් අධ්‍යක්ෂ ශ්‍රීධරන් සභානායගම්, කෑගල්ල දිස්ත්‍රික් සම්බන්ධීකාරක තුෂාර රාජපක්ෂ,කෑගල්ල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් දිලිප් නිශාන්ත, නිහිඳු ජයන්ත දෙහි අත්තගේ යන මහත්වරු ද සහභාගි වී සිටියහ.